**ශීර්ෂය 2 - අග්‍රාමාත්‍ය කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 2 - අග්‍රාමාත්‍ය කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 සැප්තැම්බර් 20 දින අග්‍රාමාත්‍ය ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම

අග්‍රාමාත්‍ය කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 619.50 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 545.81 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව කාර්යාලය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 73.69 ක් හෙවත් සියයට 11.90 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 483.19 | 470.27 | 12.92 | 2.67 |
| මූලධන | 136.31 | 75.54 | 60.77 | 44.58 |
| **එකතුව** | **619.50** | **545.81** | **73.69** | **11.90** |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

අග්‍රාමාත්‍ය කාර්යාලයට අදාළ විෂය අංක 00201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 9.90 | 6.18 | 5.90 | 7.32 | 36.00 | 28.56 |

**2.3 පොදු තැන්පත් ගිණුම්**

අග්‍රාමාත්‍ය කාර්යාලයේ තැන්පත් ගිණුම් 02 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 0.58  කි විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0013/0090/000 | 0.01 |
| 6000/0000/00/0016/0085/000 | 0.57 |
| එකතුව | 0.58 |

**2.4 විගණන නිරීක්ෂණය**

අග්‍රාමාත්‍ය කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 අධි ප්‍රතිපාදන සැලසීම**

වැය විෂයන් 11 ක් සඳහා අධිප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය සියයට 24 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.2** **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

---

ශ්‍රී ලංකාවේ 67 වන නිදහස් දින සැමරුම සඳහා පවත්වන්නට යෙදුනු සංස්කෘතික සංදර්ශනය වෙනුවෙන් 2015 පෙබරවාරි 13 දින රාජ්‍ය බැංකුවකින් රු.මිලියන 5 ක් සහ 2015 මාර්තු 12 දින තවත් රාජ්‍ය බැංකුවකින් රු.මිලියන 5ක් වශයෙන් මුළු එකතුව රු.මිලියන 10 ක් ත්‍යාග ලෙස අග්‍රාමාත්‍ය කාර්යාලයට ලැබී තිබුණි. එසේ ලැබී තිබුණු ත්‍යාග මුදල් රෙගුලාසි 170(2) ප්‍රකාරව කටයුතු කර රාජ්‍ය ආදායමට බැර කර නොතිබුණි. නිදහස් දින සැමරුම සඳහා පවත්වන්නට යෙදුනු සංස්කෘතික සංදර්ශනය වෙනුවෙන් එසේ ලබාදී තිබූ රු.මිලියන 8 ක් මුදල් රෙගුලාසි 170(2) ප්‍රකාරව කටයුතු නොකර එම නිදහස් දින උත්සවය සඳහා වියදම් කර තිබුණි. ඉතිරි රු.මිලියන 2 කින් රු.මිලියන 1.13 ක් ත්‍යාග ලබා දුන් කාර්යෙන් බැහැර වෙනත් කාර්යයක් සඳහා වැය කර තිබුණි.

**3.3** **අවිධිමත් ගනුදෙනු**

---

අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් අරලියගහ මන්දිරය පරිශ්‍රයේ මාර්ගවල කොන්ක්‍රීට් ඇතිරීම සඳහා ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 2.63 කට කොළඹ නගර සභාවට කොන්ත්‍රාත්තුව පවරා තිබුණි. 2015 ජුලි 23 දින එම කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 20 ක් වූ රු.මිලියන 0.53 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවා තිබුණි. කොන්ත්‍රාත්කරු සමඟ ඇති කර ගෙන තිබුණු ගිවිසුම අනුව 2015 අගෝස්තු 15 දින කොන්ක්‍රීට් ඇතිරීම අවසන් කළ යුතු තිබුණි. විගණන දිනය වූ 2016 මාර්තු 17 දින වන විටත් ගිවිසුම් ගත කාලය අවසන් වී මාස 06 ක් ගතවී තිබුණත්, එම කොන්ත්‍රාත්තුව නිම කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.4** **මානව සම්පත් කළමණාකරණය**

---

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

---

2015 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 31 | 27 | 04 | - |
| (ii) | තෘතියික මට්ටම | 07 | 05 | 02 | - |
| (iii) | ද්විතියික මට්ටම | 164 | 86 | 78 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 178 | 91 | 87 | - |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 05 | - | 05 |
| | එකතුව | 380 | 214 | 171 | 05 |